# ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව
# (CFHC)

## ධීවර වරාය සහ නැංගුරම් පොළවල් ආශ්‍රිත ව්‍යාපාර සඳහා පෞද්ගලික අංශයේ සහභාගීත්වය ලබා ගැනීමට ව්‍යාපෘති යෝජනා සඳහා අභිලාෂ ප්‍රකාශ කිරීම (EOI)

## CFHC/SD/EOI/2021/01

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවට අයත් ධීවර වරාය සහ ධීවර නැංගුරම් පොළවල්වල රාජ්‍ය පෞද්ගලික හවුල් ආයෝජන ආරම්භ කිරීම සඳහා දේශීය/විදේශීය ආයෝජකයන් වෙතින් අභිලාෂය ප්‍රකාශ කිරීම් (EOI) කැඳවනු ලැබේ. යෝජිත ආයෝජන පහත සඳහන් ක්ෂේත්‍රවල සිදුකළ හැකිය.

| අනු අංකය | පෞද්ගලික අංශයේ යෝජිත ආයෝජන | |
|---|---|---|
| 01. | මසුන් සැකසීම / අයිස් යන්ත්‍රාගාර / ශීත ගබඩා යටිතල පහසුකම් | ▪ මසුන් සැකසීමේ ඒකක<br>▪ අයිස් යන්ත්‍රාගාර<br>▪ ශීත ගබඩා, බ්ලාස්ට් ෆ්‍රීසර් පහසුකම්<br>▪ මසුන් ඇල්ලීමේ ආම්පන්න අලෙවිසැල් |
| 02. | අනෙකුත් ආයෝජන | ▪ ධීවර / ධීවර නොවන යාත්‍රා නිපදවීම සහ අළුත්වැඩියා කිරීමේ පහසුකම්<br>▪ වාණිජ වරාය හා සමුද්‍රීය ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා ව්‍යාපාර<br>▪ අනෙකුත් සමුද්‍රීය හා වෙරළ සම්බන්ධ වූ ආයෝජන යෝජනා |
| 03. | පුනර්ජනනීය බල ශක්ති මූලාශ්‍රිත ආයෝජන | ▪ උදම්රළ විදුලි බලාගාර<br>▪ සූර්ය බලය<br>▪ අක්වෙරළ සුළං බලය |
| 04. | සමුද්‍රාශ්‍රිත සංචාරක ක්‍රියාකාරකම් | ▪ මරිනාස්<br>▪ ක්‍රීඩාවක් ලෙස මසුන් ඇල්ලීම<br>▪ තල්මසුන් නැරඹීම / මසුන් නැරඹීම සඳහා කිමිදීම/ මුහුදුබත් වූ නෞකා නැරඹීම සඳහා කිමිදීම<br>▪ සමුද්‍රීය සංචාරක කර්මාන්තය<br>▪ වරාය ආශ්‍රිත අවන්හල්<br>▪ පොදු ප්‍රවාහනය, විනෝද චාරිකා සඳහා මගී බෝට්ටු |

ව්‍යාපෘති යෝජනා දික්ඕවිට, පානදුර, බේරුවල, අම්බලන්ගොඩ, හික්කඩුව, දොඩංදූව, ගාල්ල, මිරිස්ස, පුරාණවැල්ල, ගන්දර, සුදුවැල්ල, නිල්වැල්ල, කුඩාවැල්ල, තංගල්ල, කලමැටිය, හම්බන්තොට, කිරින්ද, වාලච්චේන, කොඩ්බේ, පේදුරු තුඩුව, මයිලඩි, කල්පිටිය, වෙල්ලමන්කර, හලාවත හා මීගමුව යන ධීවර වරායන්ට අදාලව ඉදිරිපත් කළ හැකි වේ. වරායන් පිළිබඳ විස්තර **www.cfhc.gov.lk** වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැකිය.

මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවයන් අදාල යෝජනා 2021.03.31 දිනට පෙර කොළඹ-15, රොක්හවුස් පටුමග, අංක.15, පිහිටි ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවෙහි සභාපති වෙත ලියාපදිංචි තැපෑල සහ විද්‍යුත් තැපෑල මගින් (suppliescfhc@gmail.com) ඉදිරිපත් කළ හැකිය.

ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කරනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව,"අභිලාෂ ප්‍රකාශ හා වරායේ නම" සඳහන් කළ යුතුය.

ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති යෝජනා භාර ගැනීම ප්‍රදානය කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන මණ්ඩලය සතු වේ. වැඩි විස්තර දුරකතන අංක 011-2525063 ප්‍රසම්පාදන කළමනාකාර වෙතින් විමසීමෙන් ලබා ගත හැක.

**සභාපති**

**ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව**

**අංක 15, රොක් හවුස් පටුමග,**

**කොළඹ - 15.**